Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018-2-26 |

පැමිණිලිකරු : එස්.ජේ.පී. ප්‍රනාන්දු මහතා.
ජේ.වයි.එස්.ඥානම් වැඩිහිටි නිවාසය.
නො. 110 ඒ. පමුණුගම.

වගඋත්තරකරු : අධ්‍යක්ෂ ජනරාල්.
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.
මාලිගාවත්ත. කොළඹ 10.

පැමිණිලි අංකය : **HRC/4596/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. තමා 2001.05.01 දින සිට තම පියාගේ දායකත්වය ලැබූ වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුපේ ආබාධිත විශ්‍රාම වැටුප ලබන අයෙක් බවත්. එසේ තමා වෙත ගෙවමින් සිටි ආබාධිත විශ්‍රාම වැටුප 2012 දෙසැම්බර් මාසයේ සිට අත්හිටුවීම සිදුකර ඇති බවත්ය. පැමිණිලිකරුට විශ්‍රාම වැටුප ලබාදීමට පෙර වෛද්‍ය මණ්ඩලයට යොමු කර නිර්දේශය ලබාගත්තද විශ්‍රාම වැටුප අහිමි කිරීම සිදු කිරීමේදී වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු නොකළ බවත්. තමාගේ රෝගී තත්ත්වය එලෙසින්ම පවතින බවත්. එබැවින් තමාගේ විශ්‍රාම වැටුප අහිමි කිරීම අසාධාරණ බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිල්ලට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2016.06.10 දිනැතිව වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර. එම වාර්තාව අනුව ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය යටතේ සිදුකරන ලද පරීක්ෂණය අනුව.

1. නිත්‍ය ආබාධිත තත්ත්වයක් නොමැති බවට හා රෝගී තත්ත්වයක් පවතින බවට තහවුරු වීම.

2. පැමිණිලිකරු විවාහ වී තිබුණද දික්කසාද වීමේදී ලබාදී ඇති නියත තීන්දුව අනුව බාලම දරුවාගේ භාරකාරිත්වය ආබාධිත අය වෙත ලබාදීම අනුව මෙම තැනැත්තා යහපත් මානසික තත්ත්වයෙන් සිටින අයෙකු බව තහවුරු වීම.

3. පැමිණිලිකරු වයස අවුරුදු 31 දී විවාහ ජීවිතයට ඇතුලත් වී ඇති අතර. වයස අවුරුදු 56 දක්වා විවිධ රැකියා වල නිරතව තිබීම මගින් ඔහුට තම ජීවනෝපාය සලසාගත නොහැකි ආකාරයේ ආබාධි තත්ත්වයක් නොමැතිවීම යන කරුණු මත විශ්‍රාම වැටුප ගෙවීම අත්හිටවූ බව සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ. තමාට මෙම ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප හිමිවුයේ ඔහු වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එම වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශය මත බවත්. තමා යම් මානසික රෝගී තත්ත්වයකින් පෙලෙන බව එම වෛද්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ බවත්. තමාගේ එම රෝගී තත්ත්වය තවදුරටත් පවතින බැවින් තම ආබාධිත තත්ත්වය මත හිමිවූ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප අහිමි කිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවත්ය.

මේ අනුව.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2009 හා 2009.01.07 දිනැති චක්‍රලේඛනය අනුව මෙම විශ්‍රාම වැටුප අත්හිටුවීම සඳහා තීරණය කිරීමට පෙර වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීමට ප්‍රතිපාදන සලසා ඇති නමුත් පැමිණිලිකරු වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කර ඔහුගේ නුසුදුසුතාවය තීරණය කර නොමැති අතර මෙම පැමිණිලිකරු වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීමෙන් පසු එම වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශය මත කටයුතු කිරීම සුදුසු බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම චක්‍රලේඛනය අනුව අනිවාර්ය්‍ය කාරණයක් නොවුවද විශ්‍රාම වැටුප් කපා හැරීම සඳහා නිර්දේශ ලබාදෙන ලද කමිටුවේ ස්වභාවය අනුව පැමිණිලිකරු තවදුරටත් මානසික ආබාධයකින් පෙලෙන්නෙකු ද යන්න තීරණය කිරීමේ හැකියාවක් නොමැති බැවින් මෙවැනි අවස්ථා වලදී වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීම සුදුසු වන බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් මෙම පැමිණිලිකරු වෛද්‍ය මණ්ඩලයකට යොමු

කර එම මණ්ඩලය මගින් මොහු වකුලේඛනය අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුද නුසුදුසු ද යන්න පිළිබඳව නිර්දේශ ලබාගැනීමෙන් පසු අදාළ කටයුතු සිදුකිරීම සුදුසු වන බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී පැමිණිලිකරු වෛද්‍ය මණ්ඩලය වෙත යොමු නොකොට පැමිණිලිකරුවෙත ලබා දී ඇති විශ්‍රාම වැටුප කපා හැරීමට තීරණය කිරීම තුළින් වගඋත්තරකරුවන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබයි.

නිර්දේශය :-

පැමිණිලිකරු විධිමත් පරිදි වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කොට එමගින් ලැබෙන නිර්දේශය මත ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීම පිළිබඳව තීරණය ගැනීමට කටයුතු කළ යුතුය.

2018. 03 .26 දිනට පෙර මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
B/Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.